**ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය - 2019**
**------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 51(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සාගර විශ්වවිද්‍යාලයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ට අනුකූලව අස්ථිත්වයන් විසින් පූර්ව කාලපරිච්ඡේදවලදී සිදු වී ඇති වැරදි නිවැරදි කිරීමේදී අතීතානුයෝගීව ගැලපීම් කර ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවත් රු. 18,294,286 ක හර හා රු. 1,081,250 ක බැර අගයන් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමවල සාධාරණ වටිනාකම සැලකිය යුතු තරමේ වෙනස්වීම් ඇති විට සෑම වර්ෂ තුනකටම හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනයක් සිදුකල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබූ ශුද්ධ වටිනාකම රු.500,305,508 ක් වූ විශ්වවිද්‍යාලයේ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම එම ප්‍රමිතියේ 21 වගන්තියට පටහැනිව රු. 1,301,495 ක් වූ පුනරාවර්තන ස්වභාවයේ වාහන අළුත්වැඩියා හා නඩත්තු වියදම් ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 53,925,596 ක් වූ වත්කම් අයිතම 02 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් එම වත්කම් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රත්‍යාගණනයන් සිදු කරමින් පවතී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ත්‍රිකුණාමල විද්‍යාලයේ ගොඩනැගිලි වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරා තිබූ රු. 4,153,670 ක් ගොඩනැගිලි ගිණුමට හර කිරීම වෙනුවට අත්තිකාරම් ගිණුමට හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට එම වටිනාකමින් දේපල පිරියත හා උපකරණ වටිනාකම අඩුවෙන් හා අත්තිකාරම් ගිණුම් ශේෂය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂය තුළ දී දරන ලද වියදම් නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |
| (ආ) | උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබූ පෙර වර්ෂ වලට අදාල ඉදිකිරීම් දෙකක් වෙනුවෙන් ගෙවිය යුතු රු. 3,764,056 ක් නිරවුල් කිරීමේදී උපචිත වියදම් ගිණුම හර කිරීමෙන් වූ වරද නිවැරදි කිරීමේදී අදාල වත්කම් ගිණුම හර කිරීම වෙනුවට ඌනතා හා අතිරික්තතා ගිණුම හර කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වැරදි නිවැරදි කිරීම වෙනුවෙන් ජ'නල් සටහන් යෙදීමේ දී නිවැරදිව ගිණුම් හඳුනාගෙන ගැළපීම් කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත තොරතුරු ඉදිරිපත් නොවුණි.

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අත්තිතාරම් | 3,742,163 | උපලේඛන | අදාළ ශේෂයන පැන නැඟි ආකාරය හඳුනා ගනිමින් පවතී. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ වලට අදාළ උපලේඛන පවත්වා ගත යුතුය. |
| ලැබිය යුතු පාඨමාලා ගාස්තු | 11,797,123 | | | |
| ලැබිය යුතු නේවාසිකාගාර ගාස්තු | 215,404 | | | |
| ගෙවිය යුතු ශේෂ | 34,234,573 | | | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලැබිය යුතු ගිණුම් විෂයන් 6 ක් යටතේ දීර්ඝකාලීනව පැවත එන නිරවුල් නොකරන ලද ශේෂයන්ගේ එකතු වටිනාකම රු. 844,055 ක් විය. | පිළිතුරු ලබාදී නොමැත. | ලැබිය යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2014 අංක 31 දරණ සාගර විශ්වවිද්‍යාල පනත 10(1) හා 10(3) වගන්ති | විශ්වවිද්‍යාලය සඳහා කුලපතිවරයෙකු සහ “ඇතුලත් කිරීම් ප්‍රතීතන සහ තත්ව සහතික කිරීම් සභාව ” සඳහා අධ්‍යක්ෂකවරයකු පත්කළ යුතු වුවත් විශ්වවිද්‍යාලය ආරම්භයේ සිටම එම තනතුරු සඳහා නිලධාරීන් පත්කර නොතිබුණි. | කුලපතිවරයකු පත් කිරීමට කටයුතු කරන අතර ප්‍රතීතන සහ තත්ව සහතික කිරීම් සභාව සඳහා වැඩ බලන අධ්‍යක්ෂවරයකු පත්කර ඇත. | පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුව ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 206 හා 565(2) | තැන්පතු ආපසු ගෙවීමේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව අනුගමනය කළයුතු විධිවිධාන අනුගමනය නොකළ අවස්ථා පැවතීම හේතුවෙන් යම් නිශ්චිත දිනකට එක් පුද්ගලයෙකුට / ආයතනයකට තවදුරටත් නිරවුල් කළයුතු තැන්පතු වටිනාකම හඳුනාගත නොහැකිවිය. එසේම තැන්පතු ලේඛන ද පවත්වා නොතිබුණි. | 2020 වර්ෂයේ සිට අදාළ ලේඛන පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුව ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 51,749,516 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 5,016,544 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 46,732,972 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පුද්ගල පඩිනඩි වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විශ්වවිද්‍යාලයේ පරිපාලන හා අධ්‍යයන කාර්ය මණ්ඩලයට සහ පංතිකාමර හා පුස්තකාල සඳහා භාවිතා කිරීමේ අරමුණින් 2017 දෙසැම්බර් සිට මාසික කුලිය රු. මිලියන 2.3 බැගින් වර්ග අඩි 16 800 ක පමණ වූ නව ගොඩනැගිල්ලක් කුලී පදනමට ලබාගෙන තිබුණි. මාසික කුලියට අමතරව එම ගොඩනැගිල්ලේ අභ්‍යන්තර සැකසීමේ කටයුතු සඳහා රු.මිලියන 22 ක් ද වැයකර තිබුණි.එහෙත් මේ තුළින් විශ්වවිද්‍යාලය සඳහා බඳවාගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාවේ හෝ පවත්වනු ලබන උපාධි පාඨමාලාවන්ගේ වර්ධනයක් සිදුව ඇතිබවත් හඳුනාගත නොහැකි විය. | 2020 වර්ෂයේදී කුලී ගොඩනැගලි වලින් ඉවත් වීමට කටයුතු තරනු ලැබේ. | කුලී ගොඩනැගිල්ල ලබා ගැනීමේ අරමුණ ඉටුකර ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2014 අංක 31 දරන සාගර විශ්වවිද්‍යාල පනතේ 5.1 (25) වගන්තිය අනුව පිහිටවිය යුතු Sea Training Vessel Maintenanous ඒකකය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පිහිටුවා නොතිබුණි. මෙම ඒකකයේ භාවිතයට ගැනීම් සඳහා යොදාගත හැකි 1994 සිට 2015 කාල පරාසය තුල ලැබී තිබූ Inboard , Outboard සහ අධිවේගී බෝට්ටු ලෙස යාත්‍රා 13 ක් ප්‍රාදේශීය විද්‍යාල වල නිශ්කාර්යව හා ඌනඋපයෝජිතව පැවතුනි. | කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. | පූර්ණ ධාරිතාවයෙන් වත්කම් උපයෝජනය කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේ උපාධි පාඨමාලා 04 ක් යටතේ 87 ක් වූ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 2016 වර්ෂය වනවිට සිසුන් 156 දෙනෙකු දක්වා වර්ධනය වී පැවතියද ඉන්පසුව ප්‍රමාණවත් වර්ධනයක් සිදුව නොමැති අතර 2019 වර්ෂය වන විට පාඨමාලා 05 ක් යටතේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 207 දෙනෙකු පමණක් විය. | 2020 දී පාඨමාලා 6 ක් දක්වා වර්ධනය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | පාඨමාලා හා සිසුන් සංඛ්‍යාව වර්ධනය කර ගැනීම සඳහා කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |
| (ආ) | 2015 වර්ෂයේදී වෘත්තිය පාඨමාලා (NVQ) 12ක් යටතේ පාඨමාලා හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව වූ 466 හි ප්‍රමාණවත් වර්ධනයක් සිදුව නොමැති අතර සමාලෝචිත වර්ෂයේදී එවැනි පාඨමාලා 14 ක් යටතේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 604 දෙනෙකු විය.<br>ඒ අනුව උපාධි පාඨමාලා හා වෘත්තීය පාඨමාලා සඳහා වැඩි සිසුන් ප්‍රමාණයක් ලියාපදිංචි කර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | ඉදිරියේදී ප්‍රගතිදායක තත්ත්වයක් ඇති කර ගැනීමට කටයුතු තරනු ලැබේ. | පාඨමාලා හා සිසුන් සංඛ්‍යාව වර්ධනය කර ගැනීම සඳහා කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ උපාධි , ඩිප්ලෝමා , සහතික පත්‍ර (ISO , NVQ හා Non NVQ) පාඨමාලා 23 ක් යටතේ සිසුන් 1922 දෙනෙකුගේ සහභාගීත්වයෙන් වැඩසටහන් 107 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය තුළ ළඟා කරගෙන පැවතියේ පාඨමාලා 18 ක් යටතේ වැඩසටහන් 61 ක් පමණක් වූ අතර ඒ සඳහා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 1339 ක් පමණක් විය. | පිළිතුරු ලබාදී නොමැත. | විශ්වවිද්‍යාලයේ පීඨ වල කාර්ය සාධනය වර්ධනය කර ගත යුතුව ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තංගල්ල පීඨය හා විද්‍යාලයෙහි 2015 වර්ෂයේ සිට එක් උපාධි පාඨමාලාවක් පමණක් පවත්වා ඇති අතර 40 ක්වූ බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනයක්ද සිදුව නොතිබූ අතරම 2015 වර්ෂයේදී සිසුන් 150 කගේ සහභාගීත්වයෙන් පැවැත්වෙන 08 ක් වූ සහතික පත්‍ර පාඨමාලාවන් 2019 වර්ෂය වන විට සිසුන් 79 කගේ සහභාගීත්වයෙන් පැවැත්වෙන පාඨමාලා 04 ක් දක්වා අඩුවී තිබුණි. 2018 වර්ෂයේදී පාඨමාලා කාලය වසරක් වූ එක් ඩිප්ලෝමා පාඨමාලාවක් හඳුන්වා දී ඇති අතර එහි වර්තමාන ශිෂ්‍ය සංඛ්‍යාව 20 ක් පමණ විය. එහෙත් 2015 වර්ෂයේදී රු. 23,182,974 ක් වූ පුනරාවර්තන වියදම 2019 වර්ෂය වන විට රු. 62,940,565 දක්වා වර්ධනය වී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | විශ්වවිද්‍යාලයේ පීඨ වල කාර්ය සාධනය වර්ධනය කර ගත යුතුව ඇත. |
| (ඉ) | විගණනයේදී සිදුකල නියදි පරීක්ෂාවකට අනුව මට්ටක්කුලිය පීඨයේ උපාධි පාඨමාලාවන්හි පැය 674 ක් මඟින් ආවරණය කළයුතු විෂයන් 20 කට අදාළ දේශක වාර්තා පොත් 03 ක් විගණනයට ඉදිරිපත් නොකළ අතර ඉදිරිපත් කළ දේශක වාර්තා පොත්වලද විෂයයන් 08ක් යටතේ ආවරණය කළයුතු පැය 435 ක් සඳහා වූ තොරතුරු ඇතුලත් කර නොතිබුණි.එමෙන්ම සටහන් තබා තිබූ දේශක වාර්තා පොත් අනුව විෂයයන් 38 ක් යටතේ ආවරණය කළයුතු පැය 1854 න් ආවරණය කළ බවට සටහන් යොදා පැවතියේ පැය 1218 ක් සඳහා පමණක් විය. ඒ අනුව පාඨමාලා අන්තර්ගතය ආවරණය කිරීම වාර්තා කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් හඳුන්වා දී තිබූ දේශක වාර්තා පොත් (Lecture Record Book) පිළිබඳව නිසි අධීක්ෂණයක් නොවීම , තොරතුරු අසම්පූර්ණ වීම වැනි අඩුපාඩු පැවති බව විගණනයේදී අනාවරණය විය. | නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | අදාළ තොරතුරු පද්ධති යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |
| (ඊ) | විභාග වලට පෙනී සිටි සිසුන් සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී මට්ටක්කුලිය පීඨයේ උපාධි පාඨමාලා යටතේ පැවැත්වූ විභාගවලින් ප්‍රතිඵල නිකුත් කරන ලද විෂයයන් 36 කට අදාලව ප්‍රථමවරට ප්‍රශ්න පත්‍ර 1306 කට මුහුණදීමට සිසුන් සුදුසුකම් ලබා තිබුණද ප්‍රශ්නපත්‍ර 924 ක් සඳහා පමණක් මුහුණ දී තිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලය සතුව එක් එක් පාඨමාලාවන් යටතේ විභාගවලට පෙනී සිටීමට සුදුසුකම් ලබන ශිෂ්‍ය සංඛ්‍යාව හා ඒ යටතේ විභාගවලට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව හඳුනාගැනීමට ක්‍රමවේදයක් නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය. | අතුරු සම්මත රීති හඳුන්වා දීමට කටයුතු කරනු ඇත. | අදාළ තොරතුරු පද්ධති යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | උපාධි පාඨමාලා යටතේ සති දෙකක් ඇතුලත උත්තරපත්‍ර පරීක්ෂා කර සතියක ඇගයීම් කාලයකින් පසුව විභාග ප්‍රතිඵල නිකුත්කිරීමේ ක්‍රමවේදයක් විශ්වවිද්‍යාලය විසින් හඳුන්වාදී තිබුණි. මට්ටක්කුලිය පීඨයට අදාලව සමාලෝචිත වර්ෂයේ මැයි සහ ජූනි මාස වල පවත්වන ලද විභාග සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂාව අනුව , කණ්ඩායම් 12ක විෂයන් 85 ක් යටතේ ප්‍රශ්නපත්‍ර 3036කට පෙනී සිටීමට සිසුන් සුදුසුකම් ලබා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කණ්ඩායම් 09 ක විෂයයන් 36කට අදාල පිළිතුරුපත් 924 ක් සඳහා පමණක් විභාග ප්‍රතිඵල නිකුත්කර තිබුණි. ඉතිරි ප්‍රශ්නපත්‍ර වලට සිසුන් පෙනී සිටි බවට තහවුරු කර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් විශ්වවිද්‍යාලය අනුගමනය කර නොතිබුණි. | ප්‍රමාණවත් කථිකාචාර්යවරු නොමැති බැවින් බාහිර කථිකාචාර්යවරුන් ගේ සේවය ලබා ගැනීමට සිදුව ඇත. | හඳුන්වා දී ඇති ක්‍රමවේදයට අනුගත විය යුතුය. |
| (ඌ) | පාඨමාලා අන්තර්ගතය , බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව හා අධ්‍යයන කාර්ය මණ්ඩල කටයුතු ආදිය සඳහා නිර්නායක සැකසීමට විශ්වවිද්‍යාල පනතේ 23 වන වගන්තිය අනුව බලය පැවරී ඇති ඇතුලත්කිරීම් ප්‍රතිතන හා තත්ව සහතික කිරීම් සභාව විශ්වවිද්‍යාල අරම්භ වූ 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම වාර 03 ක් පමණක් රැස්වී ඇති අතර එකී වාර වලදීද විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ අන්තර්ග්‍රහන කටයුතු පිළිබඳ පමණක් සාකච්ඡාවට බඳුන්වී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කර යුතුව ඇත. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සාගර විශ්වවිද්‍යාලය සතු ගොඩනැගිලි සංකීර්ණයෙන් වර්ග අඩි 11,778 ක ප්‍රමාණයක් ඌන උපයෝජිතව පැවතුණි. | 2020 සිට මෙම ගොඩනැගිලි සංකීර්ණය භාවිතයට ගැනීමට කටයුතු කර ඇත. | වත්කම් පූර්ණ ධාරිතාවයකින් යුතුව භාවිතා කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උපාධි පාඨමාලා පැවැත්වෙන උසස් අධ්‍යාපන අංශයෙහි කථිකාචාර්යවරුන් යටතේ අනුමත කාර්ය මණ්ඩලය 31 දෙනෙකු වූ අතර 2019 වර්ෂය අවසානයට තත්‍ය කාර්ය මණ්ඩලය 25 දෙනෙකු වූයෙන් පුරප්පාඩු 6 ක් පැවතුණි. එසේ වුවද කොන්ත්‍රාත් පදනම මත කථිකාචාර්යවරු 02 දෙනෙකුගේ හා බාහිර කථිකාචාර්යවරු 67 දෙනෙකුගේ සේවය ලබාගෙන පිළිවෙලින් රු. 1,200,000 ක් හා රු. 5,468,025 ක් දීමනා ගෙවා තිබුණි. | කථිකාචාර්යවරුන් 10 දෙනෙකු ශිෂ්‍යත්ව සඳහා විදේශගතව ඇති බැවින් අධ්‍යාන කටයුතු යාවත්කාලීනව සිදු කර ගැනීම සඳහා බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගෙන ඇත. | අනුමත කාර්ය මණ්ඩල උපරිම ධාරිතාවයකින් යොදවා ගෙන බාහිර දේශකවරුන්ගේ සේවය ලබා ගැනීම අවම කළ යුතුය. |
| (ආ) | වෘත්තීය පාඨමාලා පැවැත්වෙන වෘත්තීය අධ්‍යාපන අංශයෙහි උපදේශකවරුන් යටතේ අනුමත කාර්ය මණ්ඩලය 74 දෙනෙකු වූ අතර 2019 වර්ෂය අවසානයට තත්‍ය කාර්ය මණ්ඩලය 18 දෙනෙකු විය. මීට අමතරව කොන්ත්‍රාත් පදනමට උපදේශකවරුන් 25 දෙනෙකු හා බාහිර උපදේශකවරුන් 79 දෙනෙකුගේ සේවය ලබාගෙන පිළිවෙලින් රු. 9,976,285 ක් හා රු.5,735,245 ක් දීමනා ලෙස ගෙවීම්කර තිබුණි. | අන්තර්ගහන කටයුතු අවසන් නොවීම හා බඳවා ගැනීමේ පටිපාටි අනුමත නොවීම මේ සඳහා හේතු වී ඇත. | ස්ථිර කාර්ය මණ්ඩලය බඳවා ගෙන බාහිර කථිකාචාර්යවැන්ගේ සේවය ලබා ගැනීම අවම කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 අංක 31 දරන ශ්‍රී සාගර විශ්වවිද්‍යාල පනතේ 54 වගන්තිය ප්‍රකාරව යම් මූල්‍ය වර්ෂයකට අදාලව වාර්ෂික අයවැය ඇස්තමේන්තු සහ වාර්ෂික අයවැයගත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | 2020 වර්ෂයෙ සිට අයවැය පිළියෙල කරනු ලැබේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව අයවැය ඇස්තමේන්තු පිළියෙල කළ යුතුව ඇත. |